# ලංසු කැඳවීමයි

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.

වෙළඳ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා වෙන්නප්පුව බස් නැවතුම්පල භූමියේ ඩිජිටල් දැන්වීම් පුවරුවක් ස්ථාපිත කිරීම සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාබල ප්‍රදේශයේ පදිංචි සුදුසු ආයෝජකයෙකු සම්බන්ධ කර ගැනීම සඳහා ලංසු කැඳවනු ලැබේ. ලංසු අයදුම්පත් 2026.04.06 දින දක්වා කාර්යාල වේලාවන් තුළ වෙන්නප්පුව ප්‍රාදේශීය සභා කාර්යාලයට පැමිණ ලබාගත හැකිය. ලංසු අයදුම්පත් ගාස්තුව රු.5000.00 කි. ලංසු අයදුම්පත් 2026.04.07 දින ප.ව 2.30 ට පෙර ලේකම් ප්‍රාදේශීය සභාව, වෙන්නප්පුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දිය යුතුය.

ලංසු අයදුම්පත් පත් බහාලන ලිපිකවරයේ ඉහල වම් කෙලවරේ "ඩිජිටල් නාම පුවරුවක් සඳහා ආයෝජකයෙකු තෝරා ගැනීමට ලංසු ඉදිරිපත් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය. ලංසු අයදුම්පත් විවෘත කිරීම 2026.04.07 දින ප.ව 2.30 ට සිදු කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

**<u>ලංසු කැදවීමට අදාල කොන්දේසි</u>**

01. සවිකරනු ලබන දැන්වීම් පුවරුව 8"x12" ප්‍රමාණය වන අතර, වගකීම් කාලය වසර 05 ක් වේ.
02. ආයෝජකයා විසින් ඉදිරිපත් කළ යුතු ලංසුව රුපියල් මිලියන 04 ට වැඩි විය යුතුය.
03. දැන්වීම් පුවරුව ස්ථාපිත කිරීම සඳහා ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලංසු මුදල වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු වේ. එම මුදලට අමතරව දැන්වීම් පුවරුව ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය වන ඉතිරි මුදල වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව විසින් දරනු ලැබේ.
04. ලංසු අයදුම්පත් සමග රුපියල් මිලියන 0.5 ක ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. මෙම ඇපකරය 2026.08.23 දින දක්වා වලංගු විය යුතුය.
05. මෙම ලංසු කැදවීම අනුව ගිවිසුම් ගත වීමෙන් පසුව ලංසු ඇප මුදල නිදහස් කරනු ලැබේ.
06. දැන්වීම් පුවරුව ස්ථාපිත කිරීම සඳහා සුදුසු ආයතනයක් තෝරාගනු ලබන්නේ ලංසු කැදවීමක් මගිනි. ලංසු කැදවීම හා ටෙන්ඩර් ප්‍රදානය සිදු කරනු ලබන්නේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ටෙන්ඩර් මණ්ඩලය විසිනි.
07. දැන්වීම් පුවරුව ස්ථාපිත කිරීම සඳහා තෝරාගනු ලබන සැපයුම්කරු සමග ගිවිසුම්ගත වීමට ප්‍රථම ආයෝජකයා විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු මුදල වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතුය.
08. දැන්වීම් පුවරුව ස්ථාපිත කිරීමෙන් පසුව දැන්වීම් ප්‍රදර්ශනය ආරම්භ කිරීම, දැන්වීම් ගාස්තු තීරණය කිරීම, දැන්වීම් භාර ගැනීම දෙපාර්ශවයේ එකගතාවය මත සිදු කළ යුතුවේ.
09. දැන්වීම් භාර ගැනීමේ හා ගාස්තු අය කර ගැනීමේ වගකීම වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සතුවේ.
10. දෙපාර්ශවය වෙත එක් දිනකට නොමිලයේ ලැබෙන ප්‍රදර්ශන කාලය විනාඩි 90 කි. දෙපාර්ශවයේ එකගතාවය මත මෙම කාලය සංශෝධනය කර ගත හැකිය. දැන්වීම් පුවරුව ස්ථාපිත කිරීමෙන් පසුව දැන්වීම් වලින් ලැබෙන ආදායමෙන් එම මාසයේ වියදම් අඩු කළ විට ලැබෙන ශුද්ධ ලාභයෙන් 50% අයෝජකයා වෙත ඊලග මාසයේ 10 දිනට පෙර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතුය. යම් මාසයක දී අලාභයක් ඇති වුවහොත් එම අලාභයෙන් 50% දැනුම් දුන් දිනයේ සිට දින 14 ක් ඇතුලත ආයෝජකයා විසින් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය. මාසිකව ආදායම් වියදම් වාර්තා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව විසින් ආයෝජකයා වෙත ලබා දිය යුතුය.
11. ආයෝජකයා සමග අත්සන් කරනු ලබන ගිවිසුමේ වලංගු කාලය වසර 05 කි. ගිවිසුම් ඇප මුදල රුපියල් මිලියන 01 කි. ගිවිසුම් කාලය දෙපාර්ශවයේ එකගතාවය මත දීර්ඝ කළ හැකිය.

ටී.බී.ඩී ඇන්ටනි කුමාර්
සභාපති,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.

2026.03.20 දින
වෙන්නප්පුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දිය.
031-2255276

ටී.බී.ඩී. ඇන්ටනි කුමාර්
සභාපති
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

Scanned with CamScanner